# ශාන්ත පීතර විදුහල - කොළඹ 04

## පළමු වාර පරීක්ෂණ - 2020

## 06 ශ්‍රේණිය - නර්තනය

කාලය පැය
1 1/2

### I කොටස

- පහත සඳහන් ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පහත සඳහන් අංග අතරින් ගැමි නැටුමක් වන්නේ,

i. බුලත් පදය
ii. ගොයම් නැටුම
iii. හනුමා වන්නම
iv. ගොඩසරඹ නර්තනය

02. කළගෙඩි නර්තනය සඳහා යොදාගන්නා උපකරණයකි,

i. ලී දෙකක්
ii. තාලම්පට
iii. කලය
iv. හොරණෑව

03. තාල තැබීම සඳහා යොදාගන්නා වාද්‍ය භාණ්ඩයකි,

i. දඬු බෙරය
ii. හක්ගෙඩිය
iii. බටනලාව
iv. තාලම්පට

04. පාසරඹ නැටීම සඳහා යොදාගැනේ,

i. ගැටබෙරය
ii. දණ්ඩි කඳ
iii. දවුල
iv. රබාන

05. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් පා සරඹ ගණන,

i. 12 කි
ii. 16 කි
iii. 3 කි
iv. 18 කි

06. අත් සරඹ යනු,

i. ගොඩසරඹ වේ
ii. පා සරඹ වේ
iii. වන්නම් වේ
iv. ගැමි නැටම වේ

07. නර්තනයේ මූලික හැඩතලය වන්නේ,

i. කෙලින් සිටීම.
ii. "V" අක්ෂරයේ දෙපා පිහිටුවීම.
iii. මැණ්ඩියට සිටීම.
iv. දෙපා මිටිරියනක පරතරයකින් තැබීම.

08. "ඉරට ඔබිය ඉර මුදුනේ සිටියා" මෙය,

i. ලී කෙලි කවියකි.
ii. කලගෙඩි කවියකි.
iii. ඉර පිළිබඳ වර්ණනාවකි.
iv. පරිසරය පිළිබඳ ගීතයකි.

09. උඩරට නර්තනය සඳහා යොදාගනු ලබන්නේ,

i. දෙවොල් බෙරයකි
ii. තම්මැට්ටහකි
iii. ගැටබෙරයයි
iv. සෝෂකයයි

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

10. දේශීය නර්තන සම්ප්‍රදායන්,

i. 4 කි
ii. 3 කි
iii. බහුලවේ
iv. 1 කි

**(ලකුණු 2×10=20)**

**පහත සඳහන් වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද අදාල ස්ථානයේ ලකුණු කරන්න.**

01. මැණ්ඩියේ දී දෙපා අක්ෂර පරතර මිටිරියනකි. ( )

02. තාලම්පට යනු ලෝහ වලින් නිපදවූ භාණ්ඩයකි. ( )

03. පාද ක්‍රමාණුකූලව හැසිරවීමට පා සරඹ මගින් පුහුණු කෙරේ. ( )

04. හනුමා වන්නම සුළු තනි තිතට ගායනා කෙරේ. ( )

05. ලී කෙලි නැටුම සඳහා කලය භාවිතා වේ. ( )

**(ලකුණු 2×5=10)**

**A කොටස ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා අදාල අංකය හිස් කොටුව තුළ ලියන්න.**

| | | | | |
|---|---|---|---|---|
| 01. | පෝළි සැදී අඟනෝ සැරසීලා | ☐ | 1. | අත් සරඹ |
| 02. | ගොඩ සරඹ | ☐ | 2. | නම්‍යතා අභ්‍යාස |
| 03. | සුළු තනි තිත | ☐ | 3. | 12 + 12 |
| 04. | ගැට බෙරය | ☐ | 4. | කලගෙඩි කවි |
| 05. | සිරුරේ නම්‍යතාවය ඇති කිරීම | ☐ | 5. | උඩරට නැටුම් |

**(ලකුණු 2×5=10)**

පහත සඳහන් සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

01. i. දෙවන පා සරඹ පදය ප්‍රස්තාර කරන්න.
ii. තුන් වන පා සරඹ පදය ලියන්න.

02. i. තෛපොංගල් උත්සවය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (වාක්‍ය 03 ක් ප්‍රමාණවත් වේ.)
ii. එම උත්සවයේ දක්නට ලැබෙන බිම සැරසිල්ලක් (කෝලම්) රූප සටහනක් අඳින්න.

03. i. ඔබ දන්නා ලී කෙලි කවියක් ලියන්න.
ii. ලී කෙලි නැටුමක රූප සටහනක් අඳින්න.

**(ලකුණු 10×3=30)**

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“Education is not preparation for life; education is life itself.” — John Dewey




Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only